වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயலாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2021



පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

நன்னடத்தை, சிறுவர்பராமரிப்புச்சேவைகள்திணைக்களம்

பீபிரிவு, 3 ஆம்மாடி, செத்சிறிபாயகட்டம் II, பத்தரமுல்லை.

Department of Probation and Child Care Services

Section B, 3rd Floor, Stage II, Sethsiripaya, Battaramulla

2021 වර්ෂය සඳහා

වාර්ෂික කාර්යය සාධන වාර්තාව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 217

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බී කොටස, 3 වන මහල, සෙත්සිරිපාය II වන අදියර, බත්තරමුල්ල.

පෙළගැස්ම

01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 2
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 3
1.3 ප්‍රධාන කාර්යයන් 4
1.4 සංවිධාන සටහන 5
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 6
1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 6

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

03. 2021 දෙසැම්බර්31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 19

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 20
3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 22
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 23
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 25
3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය 26
3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 27
3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 29
3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව 30

04. ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 37

05. තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය 39

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 40
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 43

06. මානව සම්පත් පැතිකඩ 45

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 46
6.2 ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය 46
6.3 මානව සම්පත් සංවර්ධනය 46
6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය 48

07. අනුකූලතා වාර්තාව 49

01

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

වර්ෂ එක්දහස් නවසිය තිස් ගණන්වලදී ශ්‍රී ලංකාවේ අධිකරණය විසින් පරිවාස ක්‍රමය අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කරනු ලැබීය. 1907 දී එංගලන්තයේ සම්මත කරන ලද වරදකරුවන් පිළිබඳ පරිවාස ආඥා පනත ලංකා අධිකරණය කෙරේ ද බලපෑවේය. වර්ෂ 1944 දී සම්මත කරන ලද අංක 22 දරණ පරිවාස ආඥා පනත ඉහත සඳහන් කළ බලපෑම් වල ප්‍රතිඵලයක් විය. මෙම ආඥා පනත තුළින් පරිවාස ක්‍රමය ලංකා අධිකරණයේ ස්ථාපිත විය.එංගලන්තයේ පරිවාස සේවාව ඇසුරින් ලංකාවේ ද පරිවාස සේවාවන් ආරම්භ කිරීමේ කාර්යභාරය එංගලන්තයේ උපදේශකයෙකු වන එච්.ඒ.ලීඩින් මහතාට පැවරුණු අතර, ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා සම්බන්ධ පරිවාස සේවාව පරිවාස නිලධාරීන් කීපදෙනෙකුගෙන් ආරම්භ විය. අත්හදා බැලීමක් ලෙස දිවයිනේ අධිකරණ කොට්ඨාශ කීපයක පමණක් ක්‍රියාත්මක කිරීමෙන් පසු මෙම සේවය අධිකරණය විසින් පිළිගනු ලැබීය. ඉන්පසු එය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය ද ඉස්මතු විය.

1949 දී විනිශ්චයකාර ග්‍රේෂියන් මහතාගේ ප්‍රධානත්වයෙන් පත්කරන ලද කමිටුවේ නිර්දේශ රජය විසින් පිළිගනු ලැබීමත් සමඟ දිවයින පුරා සියළුම අධිකරණ කලාප ආවරණය වන පරිද්දෙන් පරිවාස සේවය ව්‍යාප්ත කෙරිණ. මෙම සේවාවේ පරිපාලන කටයුතු කරන ලද්දේ බන්ධනාගාර හා පරිවාස දෙපාර්තමේන්තුව විසිනි.

ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත ක්‍රියාත්මක කිරීම හා ළමා උසාවි ආරම්භ කිරීමත් සමඟම ළමයින් සඳහා සැපයෙන සේවාවන් එක්තැන් කිරීමේ වැදගත්කම පිළිබඳව සිරිල් හැම්ලීන් මහතාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. එම නිර්දේශය අනුව 1956 ඔක්තෝම්බර් 01 දින පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ විය.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු, රැඳවුම් නිවාස, සහතික කළ පාසල්, පරිවාස කාර්යාල ඇතුළු අනෙකුත් ආයතන වල කටයුතු පරිවාස දෙපාර්තමේන්තුව යටතේ ව්‍යාප්ත වූ අතර මුළු දිවයිනම ආවරණය වන පරිදි සහකාර කොමසාරිස්වරුන් ද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ට සහායවීම සඳහා පත් කෙරිණි.

1987 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය ක්‍රියාත්මක වීමත් සමඟ එම ව්‍යූහය වෙනස් වූ අතර පරිවාස හා ළමාරක්ෂක සේවය පළාත් සභාවලට විමධ්‍යගත කරන ලදි. ඒ සමඟම මෙතෙක් කොමසාරිස්ට සහාය වීම සඳහා පත්කර සිටි සහකාර කොමසාරිස් තනතුරු ද අහෝසි විය.පළාත් සභා යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරුන් සියළු පළාත් වෙනුවෙන් පත් වූ අතර පරිවාස කාර්යාල ඔවුන්ගේ අධීක්ෂණයට යටත් විය.

1991 වර්ෂයේ දී ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට අත්සන් තැබූ අතර 1992 වර්ෂයේ දී ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාශයට පත් කරන ලදී. එම ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියෙහි වූ ව්‍යවස්ථාවන් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය වෙනුවෙන් 1999 වර්ෂයේ දී දෙපාර්තමේන්තුව විසින් ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් ලෙස සිය ක්ෂේත්‍ර රාජකාරී ඉටුකර ගැනීම අරමුණු කර ගනිමින් නව තනතුරක් නිර්මාණය කර ඊට නිලධාරීන් බඳවා ගන්නා ලදී. මේ වන විට මෙම නිලධාරීන් දිවයින පුරාම පිහිටි දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්

කාර්යාල වලට අනුයුක්තව කටයුතු කරනු ලබයි. මෙමගින් පරිවාස විෂයය මෙන්ම ළමාරක්ෂක විෂයයට ද මූලිකත්වය ලබාදී වැඩසටහන් දියත් කෙරේ.

1956 දී ආරම්භ වූ දෙපාර්තමේන්තුව මුලින්ම සමාජ සේවා අමාත්‍යාංශය යටතට පත්විය. පසුව පත් වූ රජයන් විසින් වරින් වර විවිධ අමාත්‍යාංශ යටතට පත් කරන ලදී. 1990 වසර ආරම්භයේ දී එය ප්‍රතිසංස්කරණ පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 1994 අගෝස්තු මාසයෙන් පසුව සෞඛ්‍ය මහා මාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ද, 2001 වර්ෂයේ දී සමාජ සේවා හා ධීවර ප්‍රජාවගේ නිවාස සංවර්ධන අමාත්‍යාංශය යටතේ ද, 2002 දී සෞඛ්‍ය පෝෂණ හා සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2003 දී සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2004 වර්ෂයේ දී කාන්තා අභිවෘද්ධි හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යටතේ ද, 2005 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය යටතේ ද කටයුතු සිදු කෙරිණි. 2010 වර්ෂයේ සිට ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2015 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ ද, 2018 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතු සහ වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය යටතේද, 2019 වර්ෂයේ සිට කාන්තා හා ළමා කටයුතුම සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය යටතේද, 2020 වර්ෂයේ සිට කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය යටතේද, දෙපාර්තමේන්තුවේ කටයුතු සිදු කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ළමුන්ගේ අයිතීන් තහවුරු වූ ඔවුනට සංවේදී හිතකර සමාජයක්

මෙහෙවර

ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද, නීතිමය ගැටළුවලට බඳුන් වූ ළමයින් ද, සුවිශේෂී කර ගනිමින් සියළුම ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කරදීම.

අරමුණු

- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනය
- අනාථ, අත්හල හා අසරණ දරුවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ක්‍රියා මාර්ග ගැනීම
- නීතිමය ගැටලු වලට ලක් වූ ළමුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ තහවුරු කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම
- අදාල අමාත්‍යාංශ හා පළාත් සභා සම්බන්ධීකරණය කරමින් ඔවුන්ගේ නිර්දේශ මත ළමා අයිතිවාසිකම් සම්බන්ධව දැනට පවතින අණ පනත් ජාතික හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි සංශෝධනය කිරීම
- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු වලට අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ලබා දීම
- නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් පුනරුත්ථාපනයට අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම
- පවතින අභ්‍යන්තර වත්කම් කළමනාකරණ ක්‍රමයන් වැඩිදියුණු කිරීම
- ජනතා අවශ්‍යතා තෘප්තිමත් වන ආකාරයෙන් කාර්යක්ෂම සේවාවක් සැපයීම
- කාර්යක්ෂමව ළමා අයිතිවාසිකම් සුරැකීමට හැකි මනා කාර්ය මණ්ඩලයක් පුහුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය
- විදේ ශීය හදාවඩා ගැනීම්
- ළමුන් ගේ අධ්‍යාපන අයිතීන් තහවුරු කිරීම සඳහා වූ වැඩසටහන්
    - සෙවණ සරණ කැපකරු මාපිය ක්‍රමය මඟින් අසරණ ළමයින්ට අවශ්‍ය සහන සැලසීම
    - නැණ දිරිය ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සහන ක්‍රියාත්මක කිරීම
    - කැපකරු දෙගුරු ආධාර ක්‍රමය මඟින් ළමයින්ට අධ්‍යාපන ආධාර ලබා දීම
- ළමා අයිතිවාසිකම් තහවුරු කිරීම වෙනුවෙන් සමාජ ව්‍යුහයන් ස්ථාපිත කිරීම හා බල ගැන්වීම
- ළමුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම උදෙසා ළමා සමාජ හා ළමා සභා වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පුහුණු හා පර්යේෂණ කටයුතු
- උපදේශනය අවශ්‍ය, නීතිය සමඟ ගැටුම් ඇති කර ගත් දරුවන් වෙනුවෙන් පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම

1.4 සංවිධාන සටහන



*ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්ට අනුයුක්ත නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් මගින් නියෝජ්‍ය සහකාර කොමසාරිස් (සංවර්ධන) වෙත වාර්තා කරනු ලැබේ.

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

ශ්‍රී.ලං.ප.සේවයට අයත් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් දෙදෙනෙක්, දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරයකු, සහකාර අධ්‍යක්ෂකවරයෙකු, ගණකාධිකාරීවරයෙකු, නීති නිළධාරියකු, පරිපාලන නිලධාරියෙකු, ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරියෙකු , පරිවාස නිලධාරියෙකු, සහ ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් දෙසිය තිස්දෙදෙනෙකු ගෙන් සමන්විත මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරී මණ්ඩලයකගේ සහාය ඇතිව කොමසාරිස් විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමේ වගකීම දරනු ලැබේ.

සංවිධාන ව්‍යුහයට අයත් වන අංශ :-

1. ආයතන හා පරිපාලන අංශය
2. ගිණුම් අංශය
3. පරිවාස අංශය
4. සංවර්ධන අංශය
5. පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

(අ) ව්‍යාපෘතියේ නම : ළමුන්ගේ ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම
(ආ) දායක නියෝජිතායතනය : සේව් ද චිල්රන් ආයතනය
(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම : රු.මි. 20.612
(ඈ) ව්‍යාපෘති කාල සීමාව : අවුරුදු 4

(අ) ව්‍යාපතියේ නම : යුනිස්ෆේ වැඩ සැලැස්ම 2021/22
(ආ) නියෝජිත ආයතනය : යුනිසෙෆ්
(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම : රු. 4,190,000.00
(ඈ) ව්‍යාපෘති කාල සීමාව : වසර 2

02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය (ප්‍රාග්ධන ව්‍යාපෘති) - 2021

වැය ශීර්ෂය (A)	ව්‍යාපෘතියේ නම (B)	භෞතික කටයුතු ආරම්භ කළ දිනය	අපේක්ෂිත වැඩ නිම කිරීමේ දිනය	ව්‍යාපෘති නිමැවුම	ප්‍රධාන කාර්ය සාධන දර්ශකය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු. මී)	මූල්‍ය ප්‍රගතිය (රු. මී)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ඉලක්කය	භෞතික ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
217 - 2 -2 - 3 - 2202	ළමා නිවාස ප්‍රතිසංස්කරණය	01.01.2021	31.12.2021	ළමා නිවාස 5	ප්‍රතිසංස්කරනය කරන ලද ළමා නිවාස ගණන	4.000	4.000	100	ළමා නිවාස 5	ළමා නිවාස 5	100
	එකතුව					**4.000**	**4.000**				
217 - 2 -2 - 4 - 2202	ළමා නිවාස අධික්ෂණය තුලින් හඳුනාගත් අවශ්‍යතා සඳහා සහ පලාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තු විසින් අවම ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා සිදුකල ඉල්ලීම් සඳහා මූල්‍ය සහයයන් ලබා දීම.	01.01.2021	31.12.2021	ළමා නිවාස 5	ප්‍රතිසංස්කරනය කරන ලද ළමා නිවාස ගණන	2.7210	2.7210	100	ළමා නිවාස 5	ළමා නිවාස 5	100

	හඳුනාගත් දරුවන් නැවත සමාජගත කිරීම	01.01.2021	31.12.2021	සමාජගත කල දරුවන් 5	සමාජගත කල දරුවන් සංඛ්‍යාව	0.3500	0.3490	99.7	සමාජගත කල දරුවන් 5	සමාජගත කල දරුවන් 5	100
	දරුවන් රැකබලා ගන්නා නිලධාරීන් පුහුණු කිරීම සහ උපදේශන සේවා මධ්‍යස්ථානය සඳහා සම්මත මෙහෙයුම් පරිපාටියක් සැකසීම	01.01.2021	31.12.2021	පුහුණු වැඩසටහන් 14	පුහුණු වැඩසටහන් ගණන	0.7910	0.6924	87.5	පුහුණු වැඩසටහන් 14	පුහුණු වැඩසටහන් 14	100
	ඥාතීන් නොවන කැපකරු පවුල් හදුනා ගැනීමේ නව නීති සකස් කිරීම (දරුවන් කුලවැද්දීමේ ආඥාපනත සංශෝධනය)	01.01.2021	31.12.2021	අදාළ නීති සම්පාදනය කිරීම/ නිර්ණායක සංවර්ධනය කිරීම	සම්පාදනය කල අදාළ නීති/ සංවර්ධනය කල නිර්ණායක	0.000	0.000	0	අදාළ නීති සම්පාදනය කිරීම/ නිර්ණායක සංවර්ධනය කිරීම	අදාළ නීති සම්පාදනය කිරීම/ නිර්ණායක සංවර්ධනය කිරීම	100
	ආයතනගත දරුවන් සඳහා NVQ පුහුණු ලබා දීම.	01.01.2021	31.12.2021	පුහුණු මධ්‍යස්ථාන 2	NVQ පුහුණු මධ්‍යස්ථාන	0.300	0.300	100	පුහුණු මධ්‍යස්ථාන 2	පුහුණු මධ්‍යස්ථාන 2	100

	පරිවාස නිලධාරින් සහ ළඟිප්‍රනි සඳහා පරිවාසගත කිරීම හා සම්බන්ධ නීති සහ මිනිස් ජාවාරම පිලිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම	01.01.2021	31.12.2021	පුහුණු වැඩසටහන් 3	පුහුණු වැඩසටහන් ගණන	0.338	0.286	84.5	පුහුණු වැඩසටහන් 3	පුහුණු වැඩසටහන් 3	100
	එකතුව					**4.500**	**4.348**				
217-2-2-5-2202	යහපත් දෙමාපියභාවය සහ දරුවන් හික්මවීමේ යහපත් ක්‍රමවේද පිළිබඳ ව දෙමාපියන්ගේ කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන් සහ අගය කළ යුතු දරුවකු වන්නේ කෙසේද යන්න පිළිබඳව දරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්	01.01.2021	31.12.2021	වැඩසටහන් 5	වැඩසටහන් ගණන/ සහභාගී වූ ගණන	0.935	0.935	100	වැඩසටහන් 5	වැඩසටහන් 5	100

	අවදානම් සහගත තත්ත්වයේ පසුවන දරුවන් සිටින පවුල් සඳහා ආරක්ෂණ සැලසුම් තුලින් මූල්‍ය සහ මූල්‍ය නොවන සහයයන් සැලසීම	01.01.2021	31.12.2021	ආරක්ෂණ සැලසුම් 400	ආරක්ෂණ සැලසුම් ගණන/ ප්‍රතිලාභී දරුවන් ගණන	11.670	11.447	98.1	ආරක්ෂණ සැලසුම් 400	ආරක්ෂණ සැලසුම් 374	93.5
	දරුවන් සඳහා හදිසි විපත් සහ ආපදා ප්‍රතිචාර	01.01.2021	31.12.2021	දරුවන් 450	දරුවන් ගණන	1.2205	1.163	95.3	දරුවන් 450	දරුවන් 450	100
	ආයතනගත දරුවන් (පරත්ත) සඳහා පුහුණු වීම්/ කුසලතා සංවර්ධන /ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	01.01.2021	31.12.2021	දරුවන් 14	ප්‍රතිලාභී දරුවන් ගණන	0.294	0.294	100	දරුවන් 14	දරුවන් 14	100
	නිපුනතා අධිකාරියේ සහය ඇතිව දරුවන් සඳහා NVQ සහතික	01.01.2021	31.12.2021	මධ්‍ය ස්ථාන 1	කාර්යය අවසන් කල %	0.551	0.5510	100	මධ්‍යස්ථාන 1	මධ්‍යස්ථාන 1	100

	ලබා දෙන මධ්‍යස්ථානයක් බවට මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම.										
	ළමා සමාජ සහ ළමා සභා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම (ව්‍යවස්ථාව මුද්‍රණය කිරීම)	01.01.2021	31.12.2021	සංශෝධිත ව්‍යවස්ථාව, පිටපත් 500	සංශෝධිත ව්‍යවස්ථාව /රැස්වීම් ගණන/ මුද්‍රණය කල පිටපත් ගණන	0.000	0.000	0	සංශෝධිත ව්‍යවස්ථාව, පිටපත් 500	සංශෝධිත ව්‍යවස්ථාව, පිටපත් 500	100
	හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා දරුවන් බලගැන්වීම- ළමා මූලික පර්යේෂණ	01.01.2021	31.12.2021	පර්යේෂණ 8	සිදු කල පර්යේෂන සංඛ්‍යාව	0.216	0.1455	67.4	පර්යේෂණ 8	පර්යේෂණ 6	75
217-2-2-5-2202	ළමා සමාජ සහ ළමා සභා රැස්වීම් පැවැත්වීම - ප්‍රාදේශීය මට්ටම	01.01.2021	31.12.2021	රැස්වීම් 325	රැස්වීම් ගණන	0.8140	0.7929	97.4	රැස්වීම් 325	රැස්වීම් 341	100
	ළමා සමාජ සහ ළමා සභා රැස්වීම්	01.01.2021	31.12.2021	රැස්වීම් 25	රැස්වීම් ගණන	0.0625	0.0624	99.8	රැස්වීම් 25	රැස්වීම් 33	100

	පැවැත්වීම - දිස්ත්‍රික් මට්ටම										
	ජාතික ළමා සභාව	01.01.2021	31.12.2021	රැස්වීම් 1	රැස්වීම් ගණන	0.000	0.000	0	රැස්වීම් 1	රැස්වීම් 1	100
	ළමා සභා සාමාජිකයින් සහ පහසුකරුවන් සඳහා විශේෂ වැඩසටහන්	01.01.2021	31.12.2021	ව්‍යාපෘති 4	ව්‍යාපෘති ගණන	0.080	0.080	100	ව්‍යාපෘති 4	ව්‍යාපෘති 4	100
	ළමා සමාජ සහ ළමා සභා දරුවන් ගේ "නිම්තෙර සභරාව"	01.01.2021	31.12.2021	සභරා 25	සභරා ගණන	0.625	0.600	96	සභරා 25	සභරා 24	96
	ඉදිරි දෙවසර සඳහා ළමා අයිතිවාසිකම් පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවට නව සාමාජිකයින් පත් කිරීම සහ එහි රැස්වීම් පැවැත්වීම.	01.01.2021	31.12.2021	පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව / රැස්වීම් 1	පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව / රැස්වීම් ගණන	0.000	0.000	0	පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව / රැස්වීම් 1	පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව / රැස්වීම් 1	100

	ළමා සංවර්ධන කම්වු පිළිබඳ මාර්ගෝපදේශ යෙහි දක්වා ඇති රාජකාරී ග්‍රාම නිලධාරී රාජකාරි ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීම සහ ඒ අනුව චක්‍රලේඛය නිකුත් කිරීම	01.01.2021	31.12.2021	අනුමැතිය/ලිපිය නිකුත් කිරීම	අනුමැතිය/ලිපිය නිකුත් කිරීම	0.000	0.000	0	අනුමැතිය/ලිපිය නිකුත් කිරීම	අනුමැතිය/ලිපිය නිකුත් කිරීම	100
	ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය මෙහෙයුම් කම්වු රැස්වීම් පැවැත්වීම	01.01.2021	31.12.2021	රැස්වීම් 394	පවත්වන ලද රැස්වීම් ගණන	0.986	0.9727	98.6	රැස්වීම් 394	රැස්වීම් 402	100
	පලාත් රැස්වීම්	01.01.2021	31.12.2021	රැස්වීම් 3	පවත්වන ලද රැස්වීම් ගණන	0.008	0.008	97.5	රැස්වීම් 3	රැස්වීම් 3	100
	ආදර්ශ ගම්මාන සඳහා වැඩසටහන් පැවැත්වීම	01.01.2021	31.12.2021	ආදර්ශ ගම්මාන 25	ආදර්ශ ගම්මාන සංඛ්‍යාව	2.3705	1.7540	73.9	ආදර්ශ ගම්මාන 25	ආදර්ශ ගම්මාන 21	84

	අන්තර්ජාලය තුළ දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම පිණිස දෙමාපියන් දැනුවත් කිරීම	01.01.2021	31.12.2021	වැඩසටහන් 139	වැඩසටහන් සංඛ්‍යාව	0.6945	0.5840	84.1	වැඩසටහන් 139	වැඩසටහන් 120	86.3
	ආන්තික ප්‍රජාවගේ දරුවන් සඳහා ජංගම සේවා පැවැත්වීම හා නෛතික ලියකියවිලි ලබා දීම	01.01.2021	31.12.2021	වැඩසටහන් 36	වැඩසටහන් සංඛ්‍යාව/ ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව	1.000	1.000	99.9	වැඩසටහන් 36	වැඩසටහන් 36	100
	අවාසි සහගත ප්‍රජාව සම්බන්ධයෙන් දිස්ත්‍රික්/ප්‍රාදේශීය මට්ටමින් ඉදිරිපත් වූ ව්‍යාපෘති යෝජනා සඳහා මූල්‍ය සහයයන් ලබා දීම	01.01.2021	31.12.2021	වැඩසටහන් 32	ව්‍යාපෘති යෝජනා /වැඩසටහන් සංඛ්‍යාව	0.600	0.600	100	වැඩසටහන් 32	වැඩසටහන් 32	100
	බණ්ඩාරණායක පුර වීදි දරුවන් සඳහා පවත්වා ගෙන යන සැඳෑ සුරකුම්	01.01.2021	31.12.2021	වැඩසටහන් 19	වැඩසටහන් සංඛ්‍යාව/ ප්‍රතිලාභී දරුවන් සංඛ්‍යාව	0.420	0.420	100	වැඩසටහන් 19	වැඩසටහන් 19	100

	මධ්‍යස්ථානය සඳහා පහසුකම් සැපයීම										
	ප්‍රගති සමාලෝචන රැස්වීම (ජාතික, දිස්ත්‍රික්) සහ සහන් එළිය වැඩසටහන	01.01.2021	31.12.2021	රැස්වීම් 234	රැස්වීම් ගණන	1.2750	1.2559	98.5	රැස්වීම් 234	රැස්වීම් 269	100
	සැලසුම් හා ප්‍රගති අධීක්ෂණ උපාය මාර්ග පිළිබඳ ධාරිතා සංවර්ධන වැඩසටහන	01.01.2021	31.12.2021	වැඩසටහන් 1	වැඩසටහන් ගණන	0.2600	0.2600	100	වැඩසටහන් 1	වැඩසටහන් 1	100
	පවත්නා යාන්ත්‍රණය (කාර්ය සාධන වාර්තා) තුළින් නිලධාරීන්ගේ කාර්ය සාධනය අඛණ්ඩව අධීක්ෂණය කිරීම.	01.01.2021	31.12.2021	රාජකාරී දිනපොත් 500	මුද්‍රණය කල රාජකාරී දිනපොත් ගණන	0.376	0.3760	100	රාජකාරී දිනපොත් 500	රාජකාරී දිනපොත් 500	100
	විශ්ව ළමා දිනය වෙනුවෙන් වැඩසටහන් සහ මුද්‍රණ හා ප්‍රචාරක කටයුතු	01.01.2021	31.12.2021	වැඩසටහන් 363	වැඩසටහන් ගණන	5.542	5.542	100	වැඩසටහන් 363	වැඩසටහන් 363	100
	එකතුව					**30.000**	**28.844**				

217-2-2-6-2202	කඩින් කඩ පාසල් යන හෝ පාසල් හැරයාමේ අවදානමක් ඇති දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම	01.01.2021	31.12.2021	දරුවන් 1943	ප්‍රතිලාභී දරුවන් ගණන	1.962	1.9539	99.6	දරුවන් 1943	දරුවන් 1935	99.6
	කැපකරු දෙගුරු	01.01.2021	31.12.2021	දරුවන් 2000	දරුවන් ගණන	16.800	16.7244	99.5	දරුවන් 2000	දරුවන් 2000	100
	වෛද්‍ය හා පෝෂණ ආධාර ලබා දීම	01.01.2021	31.12.2021	දරුවන් 554	ප්‍රතිලාභී දරුවන් ගණන	3.000	2.9754	99.2	දරුවන් 554	දරුවන් 550	99.2
	නිවුන් දරු ආධාර වැඩසටහන	01.01.2021	31.12.2021	පවුල් 323	ප්‍රතිලාභී දරුවන් ගණන	2.5575	2.5200	98.5	පවුල් 323	පවුල් 318	98.4
	ගංවතුරින් අසරණ වූ දරුවන් සඳහා ආධාර	01.01.2021	31.12.2021	දරුවන් 22	ප්‍රතිලාභී දරුවන් ගණන	0.5259	0.5186	98.6	දරුවන් 22	දරුවන් 22	100
	සෙනෙහස ආධාර (සුනාමි ව්‍යසනයෙන් අසරණ වූ දරුවන් සඳහා)	01.01.2021	31.12.2021	දරුවන් 9	ප්‍රතිලාභී දරුවන් ගණන	0.117	0.117	100	දරුවන් 9	දරුවන් 9	100
	විපතට පත් දරුවන් සඳහා හදිසි ආධාර ආධාර ලබා දීම	01.01.2021	31.12.2021	දරුවන් 69	ප්‍රතිලාභී දරුවන් ගණන	0.345	0.330	95.6	දරුවන් 69	දරුවන් 66	95.6

	හදිසි විපත්වලින් අසරණ වූ දරුවන්ට ප්‍රතිචාර දැක්වීම.	01.01.2021	31.12.2021	දරුවන් 400	දරුවන් ගණන	0.6066	0.5971	98.4	දරුවන් 400	දරුවන් 400	100
	පරිසරය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් දරුවන්ගේ මැදිහත්වීම ශක්තිමත් කිරීම	01.01.2021	31.12.2021	ව්‍යාපෘති 2	ව්‍යාපෘති ගණන/ ළමුන් විසින් ආරම්භ කරන ලද මැදිහත්වීම්	0.086	0.0860	100	ව්‍යාපෘති 2	ව්‍යාපෘති 2	100
	උප එකතුව					**26.000**	**25.822**				
	මුලු එකතුව					**64.500**	**63.014**				

03

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර

සඳහා වන

සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය 2021 රු.	තත්‍ය නැවත ගලපන ලද 2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-		
-	භාණ්ඩාගාර අග්‍රිම		323,268,000	302,919,000	ඒසීඒ-3
-	තැන්පතු		1,592,875	2,318,063	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		13,386,895	10,149,091	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**338,247,770**	315,386,154	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**338,247,770**	315,386,154	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		2,972,646	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		335,275,124	315,386,154	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
293,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	295,670,326	287,092,775	
36,950,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	34,166,182	31,663,030	
5,750,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	4,033,241	5,185,070	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	

336,500,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**333,869,749**	323,940,875	
	මූලධන වියදම්				
300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	163,165	68,795	
3,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	2,631,358	2,116,052	
64,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	63,019,079	32,673,380	ඒසිඒ2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,400,000	හැකියා වර්ධනය	**14**	1,398,624	290,887	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
69,200,000	**මුළු මූලධන වියදම් (උ)**		**67,212,226**	35,149,114	
	තැන්පතු ගෙවීම්		1,361,924	2,371,146	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		12,365,939	4,110,675	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		13,727,863	6,481,821	
405,700,000	**මුළු වියදම් එ = (ඊ+උ+ඌ)**		414,809,838	365,571,810	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(79,534,714)	(50,185,656)	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(79,534,714)	(50,185,656)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			-	ඒසිඒ-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
		තක්ෂ	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	81,571,822	75,401,864
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	35,497,196	36,518,152
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**117,069,018**	**111,920,016**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		35,214,482	36,466,388
දේපළ පිරියත හා උපකරණ සංචිතය		81,571,822	75,401,864
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	282,714	51,764
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**117,069,018**	**111,920,016**

පිටු අංක 09 සිට 51 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 52 සිට 67 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාපිත ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමටත් වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ මූල්‍ය කළමනාකරණ නිලධාරි
නම : කාන්තා හැඳුම සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය
05 වන මහල, සෙත්සිරිපාය - අදියර II
බත්තරමුල්ල.

ගණන්දීමේ නිලධාරි
නම : නලුඩීර නිලංග විතාන
තනතුර : ජ්‍යෙෂ්ඨ කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
ඩී සොටස, තුන්වන මහල,
සෙත්සිරිපාය දෙවන අදියර

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ මූල්‍යන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : ආර්. ඒ. ජේ. දිල්රුක්ෂි
තනතුර : ගණකාධිකාරි
දිනය : 29/02/2022
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
03 වන මහල, සෙත්සිරිපාය II වන අදියර,
බත්තරමුල්ල.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021 රු.	නැවත ගලපන ලද 2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	
ආදායම් නොවන ලැබීම්	-	164,931
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	21,523,051.00	16,897,663
අග්‍රිම ලැබීම්	323,268,000	302,919,000
අත්තිකාරම් අයකර ගැනීම්	11,824,086	9,718,450
තැන්පතු ලැබීම්	1,592,875	2,318,063
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**358,208,012**	**332,018,107**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	320,335,710	309,964,063
සහනාධාර සහ මාරුකිරීම්	4,033,241	5,185,070
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	205,722	2,427,195
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	2,972,646	164,931
අත්තිකාරම් ගෙවීම්	11,368,390	3,295,324
තැන්පතු ගෙවීම්	1,361,924	2,371,146
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**340,277,633**	**323,407,729**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**17,930,379.00**	**8,610,378**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	**17,930,379**	8,610,378
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**17,930,379**	**8,610,378**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(17,930,379)**	**(8,610,378)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

7) මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන,අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	336,500,000	336,500,000	333,869,749	99%
ප්‍රාග්ධන	69,200,000	69,200,000	67,212,226	97%

3.6 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.6-1 දිස්ත්‍රික්ක
217-2-2-5-2202, 217-2-2-6-2202

අනු අංකය	ප්‍රතිපාදනය ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	2021 ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදනය, ලබා දුන් අවසන් ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
1	කොළඹ	අවාසි සහගත තත්ත්වයේ සිටින දරුවන් ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සහ වෘත්තීය නිපුනතා සහ මූල්‍යාධාර ලබා දීම තුලින් ඔවුන් සවිබල ගැන්වීම	2,222.249	2,222.249	2,206.260	99.3
2	ගම්පහ		2,832.055	2,832.055	2,824.949	99.7
3	කළුතර		3,155.911	3,155.911	2,991.192	94.8
4	ගාල්ල		2,246.491	2,246.491	2,241.888	99.8
5	මාතර		1,958.000	1,958.000	1,912.755	97.7
6	හම්බන්තොට		2,168.490	2,168.490	2,146.323	98.9
7	අනුරාධපුර		2,136.350	2,136.350	2,127.380	99.6
8	පොලොන්නරුව		972.445	972.445	966.643	99.4
9	කුරුණෑගල		4,618.116	4,618.116	4,581.072	99.2
10	පුත්තලම		971.650	971.650	971.592	99.9
11	මහනුවර		6,133.664	6,133.664	6,120.652	99.8
12	මාතලේ		1,187.899	1,187.899	1,128.203	94.9
13	නුවර එළිය		887.700	887.700	876.660	98.7
14	රත්නපුර		3,220.765	3,220.765	2,752.025	85.4
15	කෑගල්ල		2,222.850	2,222.850	2,063.604	92.8

16	මොනරාගල		1,861.760	1,861.760	1,849.136	99.3
17	බදුල්ල		3,499.100	3,499.100	3,465.898	99.0
18	යාපනය		1,334.100	1,334.100	1,329.100	99.6
19	වවුනියාව		439.900	439.900	418.991	95.2
20	මන්නාරම		275.500	275.500	177.180	64.3
21	මුලතිවු		157.400	157.400	151.880	96.5
22	කිලිනොච්චි		294.400	294.400	293.300	99.6
23	අම්පාර		1,900.700	1,900.700	1,869.616	98.4
24	මඩකලපුව		1,464.600	1,464.600	1,409.631	96.2
25	ත්‍රිකුණාමලය		728.500	728.500	688.420	94.5
	එකතුව		**48,890.595**	**48,890.595**	**47,564.350**	**97.3**

3.6 – 2 පළාත් සභා

217-2-2-3-2202, 217-2-2-4-2202, 217-2-2-5-2202

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කිරීම ලැබෙන්නේ කුමන අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන්ද?	ප්‍රතිපාදන වෙන් කිරීමේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	අවසාන ප්‍රතිපාදන ප්‍රතිශතයක් ලෙස ප්‍රතිපාදන භාවිතය
			ආරම්භය	අවසානය		
1	මධ්‍යම	ළමා නිවාස ප්‍රතිසංස්කරණය කිරීම, අධීක්ෂණය සහ රැකබලාගන්නන් සඳහා පුහුණු වීම් පැවැත්වීම, හඳුනාගත්ත දරුවන්	890,054.82	890,054.82	890,054.82	100
2	වයඹ		168,190.00	168,190.00	168,190.00	100
3	සබරගමුව		638,240.80	638,240.80	638,240.80	100
4	උතුරුමැද		1,739,246.75	1,739,246.75	1,739,246.75	100
5	දකුණ		99,000.00	99,000.00	99,000.00	100
6	උතුර		679,456.00	679,456.00	679,456.00	100

7	නැගෙනහිර	සමාජගත කිරීම, ආයතනගත දරුවන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම, දරුවන්ගේ ජීවන නිපුණතා ඔප් නැංවීම, පරිවාස නිලධාරීන් සඳහා මිනිස් ජාවාරම වැලැක්වීම හා නීති පිළිබඳව ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.	952,345.00	952,345.00	952,345.00	100
8	බස්නාහිර		2,809,808.38	2,809,808.38	2,809,808.38	100
9	ඌව		218,435.00	218,435.00	218,435.00	100
10	ළමා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා පළාත් මට්ටමින් පරිගණක ලබා දීම		117,412.50	117,412.50	117,412.50	100
11	ළමා පුහුණු සහ උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානයේ දරුවන් (පරත්ත) සඳහා පුහුණු වීම්/ කුසලතා සංවර්ධන /ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම		304,580.00	304,580.00	304,580.00	100
12	පළාත් කොමසාරිස් රැස්වීම්		25,640.00	25,640.00	25,640.00	100
	එකතුව		**8,642,409.25**	**8,642,409.25**	**8,642,409.25**	

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	*කේත විස්තරය*	**2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය**	**2021.12.31 දිනට මූල්‍ය තත්ත්ත්ව වාර්තාව අනුව ශේෂය**	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යූහයන්	32,345,000	32,345,000		100%
9152	යන්ත්‍රෝපකරණ	46,571,822	46,571,822		100%
9153	ඉඩම්	2,655,000	2,655,000		100%
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. VOT/B/PCC/FA/2021/10
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 ජූනි 15 දින

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

1

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමෙදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 4 ක් සඳහා අධි ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම අධි ප්‍රතිපාදන සියයට 18 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමට අදාලව ඉදිරිපත් කර තිබූ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයෙහි ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්ගේ රු.748,109 ක්වූ ණය ශේෂයන් සම්බන්ධයෙන් හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ට අදාලව රු.1,333,369 ක්වූ ණය ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 503(1) ට අනුව කටයුතු නොකිරීමෙන් ගැලපුම් ඉවත් කල පසු තත්ත්ව අගයන් යටතේ වියදමේ උපරිම සීමාව හා අවම ලැබීම් ප්‍රමාණය වැඩියෙන් දක්වා තිබුණි.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල ඇතුලත් වැය විෂයයන් 03කට අදාල රු. 401,953 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1. 1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවදානම් සහිත දරුවන් වෙනුවෙන් ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ දරුවන් 400 ක් සඳහා රු.11,670,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.11,447,000 ක් වැය කර දරුවන් 374 දෙනෙකු සඳහා පමණක් මෙම සැලසුම් ක්‍රියාත්මක කර තිබුණි. ආරක්ෂණ සැලසුම් සඳහා කරනු ලැබූ ඉල්ලීම් විධිමත්ව ලේඛනගත කර නොතිබීම, ආරක්ෂණ සැලසුම් සඳහා දරුවන් තෝරා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවන ප්‍රතිපාදන නියමිත කාලය තුළ නියමිත කාර්යය සඳහා යොදා ගනු ලබන්නේ ද යන්න තහවුරු කර නොගැනීම, පසුවිපරම් ක්‍රියාවලියක් නොමැති වීම යනාදී දුර්වලතා නිරීක්ෂණය විය.

(ආ) දෙපාර්තමේන්තුව විසින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කැපකරු දෙගුරු නමින් ශිෂ්‍යත්ව ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර,සමාලෝචිත වර්ෂය තුලදී මේ සඳහා රු.16,724,400ක් වැය කර තිබුණි. ආධාර ලබා දිය යුතු දරුවන්ගේ උපරිම වයස, එක් දරුවෙකුට හිමිවන සම්පූර්ණ වාරික ප්‍රමාණය, ආධාර හිමිවන අධ්‍යාපනික හා වෘත්තීය පාඨමාලා කවරේ ද යන්න මෙම ශිෂ්‍යත්ව ආධාර ලබාදීමේදී නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි.

(ඇ) විවිධ ආර්ථික හෝ සාමාජීය සාධක පදනම් කොට ගෙන අඛණ්ඩ පාසැල් අධ්‍යාපනයේ නියැලීමට අවස්ථාව නොලැබෙන දරුවන් නැවත පාසැල්ගත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණද එම වැඩසටහන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2021 වර්ෂයේදී ලමුන් 2718 දෙනෙකු පාසැල් හැර ගොස් තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තු අනුමත කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් විසින් ළමයින්ගේ ළමා අයිතිවාසිකම් සමාජය තුළ සහතික කර දීමට කටයුතු කිරීමත්, ළමයින් විවිධාකාර අපයෝජනයන්ට ගොදුරුවන සාධකයන් හඳුනා ගනිමින් එම තත්ත්වයන්ගෙන් දරුවන්

අරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම කල යුතුය. එසේ වුවද එම නිලධාරීන් ඉටුකර ඇති කාර්යයභාරය පිලිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ හා ඇගයීම් කර ඇති බවට විගණනයේදී අනාවරණය නොකෙරුණි.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරණු ලැබේ.

ගොරකාන, ගල්කණුව පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කිහිපයක් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි.

4. තිරසර සංවර්ධන අරමුණු ලභා කර නොගැනීම.

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව විසින් 2030 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන එම අරමුණු සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ලභාවිය යුතු ඝන්ධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනා ගැනීමටද කටයුතු කර නොනිබුණි.තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යයභාරය හා සම්බන්ධ වන උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනා ගෙන නොනිබුණි.

5. මානව සම්පත් කලමනාකරණය

දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුර 2020 දෙසැම්බර් 23 දින සිට පුරප්පාඩුව පැවති අතර නිති නිලධාරී තනතුර 2014 අගෝස්තු මාස සිට පුරප්පාඩුව පැවතුණි.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - කොමසාරිස්, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

04

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂ අංකය	නිශ්චිත දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය		
		100% - 90%	**75% - 89%**	**50% - 74%**
217 -2 -2 – 3 – 2202	ප්‍රතිසංස්කරණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
217 – 2 – 2- 4 – 2202	අධීක්ෂණය කළ ළමා නිවාස සංඛ්‍යාව	√		
	ආයතනගත දරුවන් රැකබලා ගන්නන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	√		
	සමාජගත කළ හඳුනාගත් දරුවන් සංඛ්‍යාව	√		
217 – 2 – 2- 5 - 2202	සංවර්ධනය සඳහා සකස් කළ ආරක්ෂණ සැලසුම් සංඛ්‍යාව	√		
	පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		
	ලබා දුන් අධ්‍යාපනික තාක්ෂණික මෙවලම් ප්‍රමාණය	√		
	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය	√		
217-02-02-06-2202	ප්‍රතිලාභ ලැබූ දරුවන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව	√		
	පැවැත්වූ කමිටු සංඛ්‍යාව	√		

05

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන	ඉලක්කය /අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0% - 49%	50% - 74%	75% -100
වෛද්‍ය ආධාර ලබාදීම	(3) නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභ සාධනය ප්‍රවර්ධනය කිරීම	(3-2) 2030 වනවිට වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම	(3.3.5) සෞඛ්‍යමය මැදිහත්වීමක් සඳහා සහාය ලබාදුන් ළමුන් සංඛ්‍යාව (* 3.3.5 න්)			* 99.2 %
නිවුන් දරු ආධාර ලබාදීම	(2) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම	(2 -1) 2030 වනවිට දරුවන් සහ අවදානම් තත්ත්වයන්ට ලක් වී ඇති පවුල් සඳහා ප්‍රමාණවත් පෝෂණයක් වසර පුරා ලබා ගැනීමට හැකිබව තහවුරු කිරීම	(2.1.1) පෝෂණ ඌණතාවයෙන් පෙළෙණු ආධාර අවශ්‍ය ළමුන් සංඛ්‍යාව (* 2.1.1 අනුව)			* 98.4 %
හදිසි විපත් ආධාර/ සෙනෙහස ආධාර/ ගංවතුර ආධාර වැඩසටහන්	(13) දේශගුණික විපර්යාශ හා ඒවායේ බලපෑම් වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මකවීම	(13 - ආ) අවම වශයෙන් සංවර්ධනය වූ රටවල සහ කුඩා දිවයින්වල පිහිටි සංවර්ධනය වෙමින් පවතින රටවල කාන්තාවන්,තරුණයින් සහ දේශීය හා ආන්තිකරණයට ලක් වූ ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් කාලගුණික වෙනස්වීම් සඳහා ඵලදායි සැලසුම් සකස් කිරීමට හා කළමණාකරණය කිරීම සඳහා ධාරිතාවන් වැඩි දියුණු කිරීමේ යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරීම	(13.2.බී.1) අඩු ආදායම් ලාභී දරුවන් ඉලක්ක කර ගනිමින් ආපදා තත්ත්වයන් මත සිදුවන බලපෑම් අවම කරවීමට අවශ්‍යවන මූල්‍ය සහාය ලබාදෙන ළමුන් සංඛ්‍යාව			* 99.3 %
අධ්‍යාපන ආධාර/ කැපකරු දෙගුරු ආධාර සෙවණ සරණ	(4)පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	(4-1) සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස්,සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ,ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක්	(4.1.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව සියළුම මට්ටම්වල ඉගනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර කියවීමට සහ ගණිතමය			99.7 %

ආධාර වැඩසටහන්		සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම	කුශලතාවයන් සඳහා වන අවම මට්ටම් සහිත අයගේ ප්‍රමාණය			
අවදානම් දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් සකස් කිරීම	(1).සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරීම	(1.3.)පහල මට්ටමේ අයද ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම,සහ 2030 වනවිට දරිද්‍රතාවයෙන් පෙලෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත්ලෙස එමගින් ආවරණය වී තිබීම	(1.3.1) සමාජ ආරක්ෂණ තල/ක්‍රම මගින් ආවරණය සැපයෙන ජනගහනයේ ස්ත්‍රී පුරුෂභාවය අනුව, ළමුන් රැකියා වියුක්ති පුද්ගලයන් වැඩිහිටියන් ආබාධිත පුද්ගලයන් ගර්භනී කාන්තාවන් ළදරුවන් රැකියා ආශ්‍රිත අනතුරු වලට ගොදුරු වූවන් සහ දරිද්‍ර මෙන්ම අවදානම් කණ්ඩායම් හි ප්‍රමාණය			* 93.5 %
ළමා සමාජ/ ළමා සහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	(4) පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම	(4.7) 2030 වනවිට ඉගනුම ලබන සියළු දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම හා කුශලතාවයන් ලබාගෙන සිටීම.එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරසර සංවර්ධන රටාවන් මානව අයිතිවාසිකම්,සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම,ගෝලීය පුරවැසිභාවය හා සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායකවීම අදහස් වේ.	(4.3.1) ස්ත්‍රී පුරුෂභාවය අනුව පූර්ව මාස 12 තුළ විධිමත් හා නොවිධිමත් අධ්‍යාපනය සඳහා යෞවනයන්ගේ සහ වැඩිහිටියන්ගේ සහභාගීත්ව අනුපාතය			100 %

පුහුණු හා කුසලතා සංවර්ධනය	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.6) සියළුම මට්ටම්වලදී ඵලදායි වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම	(16.6.1) ප්‍රධාන රාජ්‍ය වියදම් අංශයන් අනුව (නැතහොත් අයවැය කේතයන් හෝ සමාන) මූලික අනුමත අයවැයෙන් පංගුවක් ලෙස			100 %
ළමා කේන්ද්‍රීය ආපදා අවම කිරීමේ වැඩසටහන	(11) නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම	(11.ආ) 2020 වනවිට සියළුම ආකාරයේ සියළුම මට්ටම්වල ආපදා අවදානම්අවම කිරීම පිළිබඳ සෙන්ඩායි වැඩ සැළැස්මේ ප්‍රතිපත්ති සහ සැළසුම් ක්‍රියාවට නංවන,සියළු දෙනා අන්තර්ගත වූ සම්පත් කාර්යක්ෂමතාවයෙන් භාවිතකරන, කාලගුණික වෙනස්කම් අවම කිරීමේ සහ ඒ අනුව හැඩගැසෙන,ආපදාවන්ට ඔරොත්තු දෙන ආකාරයේ නගර සහ මානව ජනාවාසවල ප්‍රමාණය සැලකිය යුතු මට්ටමෙන් ඉහළ නැංවීම	(11.ආ.1) 2015 - 2030 ආපදා අවදානම අවම කිරීම සඳහා වන සෙන්ඩායි කාර්ය රාමුවට අනුකූලව ජාතික අවදානම් අවම කිරීමේ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන රටවල් සංඛ්‍යාව			98.4 %
	(16) තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායි, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම	(16.3) සියළුම දෙනාටම නීතියේ සාධාරණත්වය ලබා ගැනීම හැකිවීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම	(16.3.1.) දරුවන්ට වෙනස් කොට සැළකීම වැළැක්වීම සඳහා සමාජගත කරන ලද ළමයින් සංඛ්‍යාව/ වැඩි දියුණු කරන ලද ළමා නිවාස සංඛ්‍යාව (*)			* 100 %

*දර්ශක අදාළ වන පරිදි සංශෝධනය කර ඇත.
*දර්ශක දෙපාර්තමේන්තුවට ලැබෙන අදාළ ඉල්ලීම් පදනම් කර සකස් කර ඇත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අභියෝග:

1. දෙපාර්තමේන්තුවට අයත් සමස්ත මානව සම්පත මේ සම්බන්ධයෙන් නිශ්චිත පුහුණු වැඩසටහනක් ලබාදීමට නොහැකිවීම
2. ජයග්‍රහණ දර්ශක සකස් කිරීමේදී දෙපාර්තමේන්තු මූලික තොරතුරු මත පමණක් පදනම්වීමට සිදුවීම
3. දෙපාර්තමේන්තු කාර්යභාරයන් සමග සෘජුවම ඉලක්ක ගැලපීමේ ඇති දුෂ්කරතාවය

ජයග්‍රහණ:

1. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් තිරසර සංවර්ධන අරමුණු සමඟ ඉලක්ක ගත කිරීම.

මානව සම්පත් පැතිකඩ

06

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	අඩුවැඩි/අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	**7**	**5**	**2**
තෘතීයික	**232**	**229**	**3**
ද්විතියික	**245**	**213**	**32**
ප්‍රාථමික	**17**	**14**	**3**

6.2 ආයතනයේ කාර්යය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපානු ලැබ ඇති ආකාරය

අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාවට අනුව ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නිලධාරීන් 18 ක පමණ හිඟයක් පවතී. පුරප්පාඩු පිරවීමේ නොහැකියාව නිසා ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට සේවාව දීමට අපහසු වී ඇත. තවද නීති නිලධාරී තනතුර හා පරිවාස නිලධාරී තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාල කටයුතු සිදු කෙරෙමින් පවතී. නීති නිලධාරී පුරප්පාඩුව තවමත් පවතින බැවින් දෙපාර්තමේන්තුවට ලැබෙන නීතිමය ගැටලු වලදී බාහිර නීති නිලධාරීන්ගේ සහය ලබා ගැනීමට සිදුවී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහන	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය) (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
කාර්යක්ෂමතා කඩඉම් විභාගය 50%	01	-	රු.29,723.75	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම
පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය	02	දින 03	රු.10,000.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම
භාණ්ඩ සමීක්ෂණය, හානි පාඩු ලේඛණය	01	දින 02	රු.3,500.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම
රජයේ නිලධාරීන්ගේ වැටුප් සැකසීම	01	දින 03	රු.5,000.00	-	දේශීය	විෂය අනුව රාජකාරී සාර්ථකව ඉටු කිරීම

සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	01	වසර 1	රු.104,500.00	-	දේශීය	රාජකාරි විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම
ළමා ආරක්ෂාව හා ළමා අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	15	වසර 1	රු.1,102,500.00		දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
ළමා ආරක්ෂාව හා ළමා අයිතිවාසිකම් පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව	18	වසර 1	රු.1,000,000.00 (UNICEF Funds)	-	දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
ආකල්ප සංවර්ධනය, සේවක අභිප්‍රේරණය සහ දෙපාර්තමේන්තු කාර්යභාරය සැලසුම් හා ප්‍රගති අධීක්ෂණය උපායමාර්ග පිළිබඳ ධාරිතාසංවර්ධන කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන	60	දින 01	රු.249,328.00	-	දේශීය	විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම ලබා දීම / රාජකාරි වගකීම හා ස්වභාවය හඳුනා ගැනීම
දර්ශනපති උපාධිය	01	වසර 1	රු.54,500.00	-	දේශීය	විෂය අනුව රාජකාරි සාර්ථකව ඉටු කිරීම
සමාජ වැඩ පිළිබඳ පශ්චාත් උපාධිය ජාතික සමාජ සංවර්ධන ආයතනය	01	වසර 2	88,900.00 (පළමු වසර ගාස්තුව 70%)	-	දේශීය	රාජකාරි විෂය ක්ෂේත්‍රයන්ට අදාල දැනුම

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන ආකාරය

ජාතික හා ජාත්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව ළමා අයිතිවාසිකම් භුක්ති විඳීමට දරුවන්ට අවස්ථාව සැලසීම දැක්ම කරගත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා යාවත්කාලීන කිරීම අත්‍යවශ්‍ය කාර්යයකි. ඊට හේතුව සමාජයේ සිදුවන වෙනස්වීම් හමුවේ අභියෝගයට මුහුණ දෙන ප්‍රධාන සමාජ කාණ්ඩය වන්නේ ළමුන්ය. එම අභියෝගයන් හඳුනාගෙන ඒවාට සාර්ථකව මුහුණ දීමට අවශ්‍ය සහය ලබා දීමට යාවත්කාලීන වූ වෘත්තීය දැනුමකින් යුත් නිලධාරීන් පිරිසක් සිටීම අත්‍යවශ්‍ය වූ කාර්යයකි. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාරවරුන් සඳහා කාලීනව සිදුවන සමාජ වෙනස්වීම් හමුවේ ළමුන් ආමන්ත්‍රණය කළ යුතු ක්ෂේත්‍රයක් පිළිබඳ විධිමත් දැනුමක් ලබා දී වඩා කාර්යක්ෂම, ඵලදායී සේවාවක් ලබා දීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියැලෙන සෙසු නිලධාරීන් වන කළමනාකරණ සේවා නිලධාරීන්, කාර්යාල කාර්යය සේවක නිලධාරීන් සඳහා ද පුහුණුවීම් සිදු කරනුයේ කාර්යාලයීය කටයුතුවල ඵලදායීතාව වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙනි.

07

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගතයුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේනම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලතා නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන් නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	වාණිජ ව්‍යාපාරයක් නොවේ	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්			
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20)යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූලය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන	

	සාකච්ඡා කිරීමෙන් අනතුරුව,අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම		අංශයෙන් සිදු කරනු ලබයි	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව,අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමුටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් සිදු කරනු ලබයි	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව,වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොඇලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව,එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක් දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			

11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත්කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් නොවේ	
15.2	රැස් කර තිබූ ආදායම්,තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආදායම් උපයන දෙපාර්තමේන්තුවක් නොවේ	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබ දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥාප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 () දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම	අනුකූල වේ.		

	සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය මත කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ගෙන්වා ගැනීමට නොහැකි විය.	
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසිම් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		